**සිංහල පරිවර්තනය**

**උ.ප.රා.සේ.කො.සභා චක්‍රලේඛ අංක : 18/2020**

මගේ අංකය : **NP/07/10/01/143**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය,
11.11.2020.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් – පරිපාලන,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් – ඉංජිනේරු සේවා,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත්.

**උතුරු පළාත් තාක්ෂණවේදී සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) III වන ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය – 2020**

උතුරු පළාත් තාක්ෂණවේදී සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරට පුරප්පාඩු වී ඇති පුරප්පාඩු සංඛ්‍යා **පහකට (05)** බඳවා ගැනීම සඳහා සීමිත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2020 දෙසැම්බර් මස** පැවැත්වීමට නියමිත බව දන්වා ඇත. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 30.11.2020 වේ.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 **2013.06.01**වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් තාක්ෂණවේදී සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීමේ පටිපාටීන් වලට අනුව නිර්දේශ කර ඇති කොන්දේසීන්ට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට ද, මුදල් රෙගුලාසිය හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** වන දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවා ආයතන සංග්‍රහයේ කාර්ය පටිපාටික සංග්‍රහය යනාදීන්ට අනුකූලව, තෝරා පත් කරගනු ලබන විභාග අපේක්ෂකයන් තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුරේ ෂෂෂ වන ශ්‍රේණියට හා පුහුණු ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 මෙම තරඟ විභාගයෙන් සමත්වන විභාග අපේක්ෂකයන් පත්වීමේ දින සිට වර්ෂයක කාලයක් වැඩබැලීපම් පරිවාස කාලය යටතේ තාක්ෂණ නිලධාරී III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කර ඇති පරිදි තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගන්නා දින සිට වසර 03 ක කාලයක් තුළ පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුයි.

02.3 තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරේ III වන ශ්‍රේණියට සෘජුවම බඳවා ගනු ලැබේ. බඳවා ගන්නා ශ්‍රේණිය වන තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරේ III වන ශ්‍රේණියට සෘජුවම බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටකදී පමණක් පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙම අභ්‍යාශලාභීන් එක් වසර පුහුණු කාලය අවසානයේදී සුදුසුකම් පරීක්ෂා කිරීමේ විභාගයකට පෙනී සිටිය යුතුයි. මෙම විභාගයෙන් සමත්වූවහොත් පමණක් III වන ශ්‍රේණියට පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

02.4 මෙම සේවාවන් ස්ථාන මාරු සහිත සේවාවන් වන බැවින් පත්වීම් ලබන අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි යන කොන්දේසියට යටත්විය යුතුයි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා මේ සම්බන්ධයෙන් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛයන් පරිදි පත්වීම් දින සිට වසර පහක් **05** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂාවට ප්‍රවීනතාවය ලබාගත යුතුයි.

02.6 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත්කිරීමට නියමිත සංඛ්‍යාව **පහකි (05).** කෙසේ නමුත් නිවේදනයේ සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ල පූර්ණය නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය :-

**03.1 පළාත් තාක්ෂණවේදී සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) III වන ශ්‍රේණියේ තනතුරට :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 පරිදි, වැටුප් කාණ්ඩය **MN 3 – 2016** ප්‍රකාර **උපලේඛන - I** හි සඳහන් තනතුරු වල III වන ශ්‍රේණියට ශුද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ **රුපියල් 31,040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57,550/- කි**. (**රුපියල්** 32,375/- යන වැටුප් පියවරට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි) එමෙන් ම ඉහත චක්‍රලේඛයෙහි **උපලේඛණ – II** හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව වැටුප් ප්‍රදානය කරනු ලැබේ.

**03.2 පළාත් තාක්ෂණවේදී සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණියේ තනතුරට :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 පරිදි, එම චක්‍රලේඛයේ **උපලේඛන - V** හි සඳහන් විධිවිධානයන් ප්‍රකාර **රුපියල් 27,140.00** මාසිකව ගෙවනු ලැබේ.

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමට සුදුසු පරිදි ශාරීරික නිරොගිතාවයකින් යුතු පුද්ගලයකු විය යුතුයි. එමෙතේම මනා චරිතයක් හා යහපත් හැසිරීමක් ඇති පුද්ගලයකු විය යුතුයි.

04.3 අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට හෝ ඊට ප්‍රථම අයදුම්කරු විසින් **සියළුම සුදුසුකම් සපුරා** තිබිය යුතුයි.

04.4 සීමිත තරඟ විභාගයට මඟින් වූ බඳවා ගැනීම් වලදී **වයස් සීමාව** අදාළ නොවේ.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

**05.1 තාක්ෂණ නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණිය (පුහුණු කාලය වසරකි)**

**(අ). අධ්‍යාපන සුදුසුකම් :**

අපොස (සා/පෙ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාර ගණනකදී** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන්ට විශිෂ්ඨ සාමාර්ථයන් සමඟ **විෂයන් හයක් (06)** සමත්වී තිබිය යුතුයි.

**(ආ). වෘත්තීය සුදුසුකම් :**

පහත සඳහන් වෘත්තීය සුදුසුකමක් සමඟ තක්ෂණ සේවය සමඟ සබැඳි සිවිල් (ඉදිකිරීම්) කටයුතු වල **වසර (05) කට** නොඅඩු අත්දැකීම් තිබිය යුතුයි.

1. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණ විද්‍යායතනයක ජාතික තාක්ෂණවේදී සහතිකය (NCT) (සිවිල්) හිමි කර තිබිය යුතුයි.

**හෝ**

2. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණ විද්‍යායතනයක වෘත්තීය ක්ෂේත්‍රයේ තාක්ෂණවේදී ක්ෂේත්‍රයේ තිබෙන ගැළපෙන තනතුරකට ජාතික සහතික පත් පාඨමාලාව (NCC) (සිවිල්) තෘප්තිමත් ලෙස හදාරා අදාළ සහතිකපත්‍රය හිමි කර තිබිය යුතුයි.

**හෝ**

3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණවේදී ආයතනයකින් උපදෙස් ලබාගත් පසු ඉහත තාක්ෂණවේදී සුදුසුකම් වලට සියළුම ආකාරයෙන් සමානකමක් ඇති තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් සුදුසුකම්.

**හෝ**

**(ඇ). සේවා අත්දැකීම්**

තාක්ෂණ සේවය සමඟ සබැඳි සිවිල් (ඉදිකිරීම්) කටයුතුවල ප්‍රාථමික මට්ටම හෝ ඊට ඉහළ සේවා අංශයක ස්ථිර, දෙපාර්තමේන්තු තනතුරක **වසර (10) ක** සක්‍රිය හා සතුටුදායක සේවා අත්දැකීමක් හිමිකර තිබිය යුතුයි.

**05.2 තාක්ෂණ නිලධාරි (සිවිල්) III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම :-**

**(අ). අධ්‍යාපන සුදුසුකම්**

අපොස (සා/පෙ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාර ගණනකදී** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන්ට විශිෂ්ඨ සාමාර්ථයන් සමඟ **විෂයන් හයක් (06)** සමත්වී තිබිය යුතුයි.

**(ආ). වෘත්තීය සුදුසුකම්**

පහත සඳහන් ආයතනයකින් තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරට සම්බන්ධන වෘත්තීය සුදුසුකමක් ලබා තිබිය යුතුයි.

(1) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි තාක්ෂණ ආයතනයෙන් ප්‍රදානය කරන ලද ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (සිවිල්) සහතිකය.

**හෝ**

(2) ජාතික පුහුණු හා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් ප්‍රදානය කරන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (සිවිල්) සහතිකය.

**හෝ**

(3) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රදානය කරන ලද ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමා (සිවිල්) සහතිකය

**හෝ**

(4) අනුමැතියලත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ප්‍රදානය කරන ලද තාක්ෂණවේදී ඩිප්ලෝමා(සිවිල්) සහතිකය.

**හෝ**

(5) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් (IESL) පැවැත්වෙන ඉංජිනේරු විභාගයෙන් පළමු කොටස සම්පූර්ණ කර තිබිය යුතුයි.

**හෝ**

(6) තාක්ෂණ නිලධාරි (සිවිල්) ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 6 (NVQ Level - 6) සම්පූර්ණ කර තිබිය යුතුයි.

**හෝ**

(7) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණවේදී සහතිකපත් නිකුත් කරන අයතනවලින් උපදෙස් ලබාගත් පසු ඉහත තාක්ෂණවේදී සුදුසුකම් වලට සියළුම ආකාරයෙන් සමානතාවයකින් යුතුබවට තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් අනුමත වෙනත් සුදුසුකම්.

**හෝ**

**(ඉ).සේවා අත්දැකීම්**

තාක්ෂණ සේවය සමග සම්බන්ධ සිවිල් (ඉදිකිරීම්) කටයුතු වල ප්‍රාථමික හෝ ඊට ඉහල සේවා අංශයක ස්ථිර, පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු තනතුරක වසර **පහක් (05)** සක්‍රිය හා සතුටුදායක සේවා අත්දැකීමක් ලබා තිබිය යුතුයි.

**සටහන :-**

කිසියම් තනතුරකට ස්ථිර පත්වීමක් ලබා දීමට ප්‍රථම හෝ කිසියම් තනතුරකට ස්ථිර පත්වීමක් ලබාදීමට අදාළ කොන්දේසිය මත සේවය කර ඇති හෝ පුහුණු කාල සීමාවක් සේ ඉහත **05.1 (ඇ)** හා **05.1 (ඈ)** යනාදි කොටස්වල සඳහන් සුදුසුකම් ලබා ගැනීමට වසර දහයක් හා වසර පහක කාලසීමාව වශයෙන් ගණන් ගනු නොලැබේ.

**සැ.යු :**

**අයදුම්කරුවන් විසින් තනතුරට අදාළ සියළුම සුදුසුකම් 020.11.30 වැනි දිනට හෝ ඊට ප්‍රථම සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.**

## 06. බඳවා ගැනීමේ ක්‍රමවේදය :-

06.1 ලිඛිත විභාගයක් මගින් කුසලතාව පදනම් කරගෙන, බඳවා ගන්නා අවස්ථාවේදී බලගැන්වී ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පටිපාටීන්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදීන්ට අනුකූලව තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුරට බඳවා ගනු ලැබේ. මෙම නිවේදනය මගින් කැඳවන ලද සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බවට නිරීක්ෂණය වන අවස්ථාවක දී මෙම තනතුර සඳහා හිමි අයිතීන් සියල්ල අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ලකුණු ප්‍රදානය කරනු නොලැබේ.

06.2 ඉහත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගෙන්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් සම්පූර්ණ ලකුණු අනුපිළිවෙළ අනුව පත්වීම් සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ.

06.3 තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරේ **III වන ශ්‍රේණියට** සෘජුවම බඳවා ගනු ලැබේ. බඳවා ගන්නා ශ්‍රේණිය වන තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරේ **III වන ශ්‍රේණියට** සෘජුවම බඳවා ගැනීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නැති අවස්ථාවකදී පමණක් පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම සම්බන්ධයෙන් තීරණය කරනු ලැබේ.

06.4 පුරප්පාඩුවලින් 03% ක් විශේෂ අවශ්‍යතාවයන් (ආබාධිත) ඇති අපේක්ෂකයන් සඳහා වෙන්කරනු ලැබේ. විභාග අපේක්ෂකයන් පත්වීම සඳහා තෝරාපත් කරගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීමට තම විශේෂ අවශ්‍යතාවය (Disability) බාධාවක් නොවන බවට වෛද්‍ය පරීක්ෂණ වාර්තා මඟින් සනාථ කළ යුතුය. නමුත් විශේෂ අවශ්‍යතාවයන් ඇති විභාග අපේක්ෂකයකු පත්වීම සඳහා සුදුසුකම් ලත්තේ ලිඛිත විභාගයට අවශ්‍ය ලකුණු ලබා ගන්නා පදනම මතයි.

## 07. විභාග ගාස්තු :-

අයදුම්කරුවන් තමන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් වටිනා මුදල **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන තැන්පත් ගිණුමට තැන්පත් කර කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුයි. හේතුව කුමක් වුවත් මෙම ගාස්තුව නැවත ගෙවීම් කරනු නොලැබේ එමෙන්ම මෙම ගාස්තුව වෙනත් විභාගයන් සඳහා මාරු කර ගැනීමට අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කරන ක්‍රමවේදය :-

08.1 මෙම දැන්වීම මඟින් දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (සෙ.මී21 x 29සෙ.මී) කඩදාසියක 1 සිට 4.7 දක්වා වූ ඡේද පළමු පිටුවේද, 4.8 සිට 7.0 දක්වා වූ ඡේද දෙවන පිටුවේද ඉතිරි කොටස් තුන්වන පිටුවේද අන්තර්ගත වන පරිදි අයදුම්පත්‍රය සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **30.11.2020** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක :393/48, කොවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

08.2 අයදුම්පත්‍ර යොමු කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"උතුරු පළාත් තාක්ෂණ සේවයට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය සඳහා වූ අයදුම්පත–2020"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

08.3 අයදුම්පත්‍රයේ ඡායා පිටපත තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත යනාදිය පිළිගන්නේ නැති අතර විභාග ප්‍රවේශපත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් යථා කාලයේදී එවනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම මගින් අයදුම්කරුහට අවශ්‍ය සියළුම සුදුසුකම් ඇති බවට පිළිගැනීමක් නොවන බව සැලකිල්ලට ගත යුතුයි

08.3 අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් විභාග දිනට අවම වශයෙන් දින 03 කට ප්‍රථම ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම්, ඒ බව දන්වා පහත සඳහන් තොරතු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කොවිල් වීදිය, නල්ලූර්, යාපනය්"** යන ලිපිනයට දැන්වීමට පියවරගත යුතුයි. (දුරකථන අංකය -021 221 9939, ෆැක්ස් අංකය -021 221 9940)

**ඉදිරිපත් කළ යුතු තොරතුරු :-**

**ආවරණ ලිපියක්, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, විභාග ප්‍රවේශ පත්‍රය යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකයක්.**

08.5 විභාගයට අයදුම් කරන විභාග අපේක්ෂකයන්ට එම අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් යොමු කරනු නොලැබේ එමෙන්ම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම කැඳවා ඇති සුදුසුකම් සම්පූර්ණ කර නැති අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 09. අනන්‍යතාවය ඔප්පු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයකටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් කුමක් හෝ එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කරන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ගුවන් ගමන් බලපත්‍රය.
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත දක්වා ඇති ලියකියවිලිවලින් කුමක් හෝ එකක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් විභාගයට පෙනී සිටීමේ හිමිකම අහිමි කිරීමේ බලය **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත,"** විසින් තම අභිමතය පරිදි සිදු කළ හැකි හිමිකම ඇත. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නියම කරන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි.

## 10. අසත්‍ය තොරතුරු සඳහා අඩුවම්:-

අයදුම්පත් සම්පූර්ණ කරන විට දැඩි අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලාගත යුතුයි. මෙම විභාගයේ නීතිරීති වලට එකඟව කිසියම් අයදුම්කරුවකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදි හෝ විභාගය අවසන් වූ පසුව හෝ සුදුසුකම් නැති අයකු බවට තහවුරු වුවහොත් ඔහුට හිමි විභාග අපේක්ෂකත්වය එම අවස්ථාවේදීව අවලංගු කරනු ලැබේ. අයදුම්කරුවකු සපයා ඇති කුමක් හෝ තොරතුරක් අසත්‍ය බවට පත්වීම් ලබා දීමෙන් පසු තහවුරු වුවහොත් පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කිරීමට පියවර ගනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අයදුම්කරුවකුම තම අත්සන සහතික කර ගැනීම අනිවාර්ය කටයුත්තකි.** රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අයදුම්කරු තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලය ලත් මගින් සහතික කර ගත යුතුයි.

## 12. විෂය නිර්දේශය :-

මෙම ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින්(02) සමන්විත වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව නොලැබේ මෙම විභාගයෙන් සමත් නොවන කිසිදු අපේක්ෂකයකුට ප්‍රශ්න පත්‍ර නැවත සමීක්ෂණ කටයුතු සඳහා විධිවිධානයන් කිසිවක් යොදා නැත.

| අංකය | ප්‍රශ්නපත්‍ර | ප්‍රශ්නපත්‍රයේ අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01. | අභියෝගාත්මතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය විවේචනාත්මක කරුණු කෙරෙහි විභාග අපේක්ෂකයන් ප්‍රවේශ වන ආකාරය හා හැකියාව, තීරණාත්මක හැකියාව හා විශ්ලේෂණ කිරීමේ හැකියාව යනාදිය අගැයීම සඳහා සකස් කරන ලද ප්‍රශ්නපත්‍රයකි. | පැය 01 . | 100 |
| 02. | තාක්ෂණවේදය හා සබැඳි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ ඉදිකිරීම් සම්බන්ධයෙන් අයදුම්කරුගේ මූලික දැනුම, ඉදිකිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය, ගොඩනැගීම් කටයුතුවලට අවශ්‍ය කෙටුම්පත (Plan) සකස් කිරීම හා කෙටුම්පත (Plan) තේරුම් ගන්නා ආකාරය, මැනීම, පදනම්, පස් වර්ගය, වීදි නිර්මාණය හා නඩත්තුව, ඇස්තමේන්තු සකස් කිරීම, ජල සැපයුම, කාණු සැකසීම හා කසල ඉවත් කිරීම යනාදි කටයුතුවල දැනුම ඇගයීම සඳහා සකස් කරන ලද ප්‍රශ්නපත්‍රයකි. | පැය 03 . | 100 |

**සටහන** :-

මෙම විභාගය තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂනයට සුදුසුකම් ලැබීමට සෑම අපේක්ෂකයන් විසින්ම වෙන් කර ඇති ලකුණු වලින් අවම වශයෙන් සීයයට හතලික ප්‍රතිශතයක් (40%) ලබාගත යුතුයි සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් ලබාගන්නා මුළු ලකුණු ප්‍රමාණයෙන් අනුපිළිවෙළ (Merit Order) ගැරුත්තිල් සැලකිල්ලට ගනු ලැබේ

## 13. විභාග ප්‍රතිඵල :-

අයදුම්කරුවන් සඳහා විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. පසුව විභාගයට පෙනී සිටි විභාග අපේක්ෂකයන් වෙත තැපැල් මගින් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුය. මෙම දැන්වීම දෙමළ හා සිංහල මාධ්‍යයන් මගින් පළ කර ඇති අතර භාෂා පාඨයන් අතර යම් කිසි අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක දී දෙමළ භාෂා මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**15.** මෙම විභාග දැන්වීම www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලයට පිවිස ලබා ගත හැකිය.

***එස්. තිරුවාකරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.
11.11.2020

01. ප්‍රධාන ලේකම්, උතුරු පළාත. -දැ. ගැ. ස

02. ආණ්ඩුකාරවර ලේකම්, උතුරු පළාත. - දැ. ගැ. ස

03. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත, උතුරු පළාත.

- අයදුම්කරුවන් වෙතින් විභාග ගාස්තු අයකර අප වෙත යොමු කිරීම සඳහා.